(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 462.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 ජූනි මස 12 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4984/'14

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශීය සමාගම් විසින් නෙළා ගන්නා බවත්;

(ii) විදේශිකයන්ගේ ධීවර යාත්‍රා සඳහා ශ්‍රී ලංකා මුහුදු කලාපය තොටුපළක් ලෙස භාවිතා කරන බවත්;

(iii) ශ්‍රී ලංකාවට මාළු ආනයනයකර ප්‍රතිඅපනයනය කරන බවත්;

(iv) ශීත කළ මාළු ශ්‍රී ලංකාවට ආනයනය කරන බවත්;

(v) ඉහත (i) සිට (iv) දක්වා සඳහන් හේතු ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයට විශාල බලපෑමක් ඇතිකර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) සිට (අ) (iv) දක්වා සඳහන් වන එක් එක් ගැටලුකාරී තත්ත්ව විසඳීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් කරුණට අදාළව ගෙන ඇති පියවර කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5248/'14

2\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල ඩී. බී. වෙලගෙදර මධ්‍ය මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරයක් ඉදි කර තිබේද;

(ii) එම විද්‍යාගාරයට අවශ්‍ය යටිතල පහසුකම් සපයා තිබේද;

(iii) එම විද්‍යාගාරය විවෘත කරන දිනය කවරේද;

(iv) එම විද්‍යාලය ද්විතීයික පාසලක් බවට පත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5988/’15

3.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ධීවර සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරීවරයෙකු වන ආර්. කේ. සමන්ත ලාල් මහතා හා පිරිස් කළමණාකාර එදිරිසිංහ මහතා සේවය අවසන් කර යමින් සිටියදී එම ආයතනයේම සේවකයෙකුගේ පෙළඹවීම මත 2015.02.25 දින පහරදීමකට ලක්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පහරදීමේ සිද්ධිය මෙහෙයවා ඇති ධීවර සංස්ථා සේවකයා හඳුනාගෙන තිබේ නම්, ඔහු කවුරුන්ද;

(ii) ඔහුට එරෙහිව ආයතනික වශයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iv) විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(v) පහරදීමේ සිද්ධිය මෙහෙයවා ඇති බවට හඳුනාගෙන ඇති පුද්ගලයාට එරෙහිව ක්‍රියාමාර්ග නොගන්නේ ද;

(vi) නැවත එවැනි සිදුවීම් සිදු නොවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6017/’15

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.24 දින කඹුරුපිටිය, නාරංදෙනිය ජාතික පාසල් ක්‍රීඩාංගණයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් පවත්වනු ලැබුවේද;

(ii) ඒ සඳහා විදුහල්පතිගේ හෝ ජාතික පාසල් අධ්‍යක්ෂවරයාගේ අවසරය ලබාගෙන තිබේද;

(iii) ඉහත සඳහන් දිනයේ පැවති ජනාධිපති අපේක්ෂක ප්‍රචාරක රැස්වීම වෙනුවෙන් 2014.12.16 දින ඉහත සඳහන් පාසලේ තාප්පය කඩා ඉවත් කළේද;

(iv) පාසල් කමිටුවේ ඉල්ලීමක් මත විදුහල්පතිවරයා විසින් එම තාප්පය කඩා ඉවත් නොකරන ලෙස පොලිසියට පැමිණිලි කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තාප්පය කඩා ඉවත් කිරීම නිසා ක්‍රීඩා පිටියට සහ පාසලේ දරුවන්ගේ ආරක්ෂාවට හානිකර තත්ත්වයක් ඇති වී තිබේද;

(ii) දේශපාලනමය අවශ්‍යතාවයක් මත කඩා ඉවත්කරන ලද තාප්පයට දරන ලද වියදම කොපමණද;

(iii) එම තාප්පය පාසල් දරුවන්ගේ මව්පිය මූල්‍ය ආධාර යටතේ ඉදිකරනු ලැබූවක්ද;

(iv) කඩා දමන ලද තාප්පය යථා තත්ත්වයට පත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6036/ 15

5\.

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත තනතුරෙහි සිටි තමරා කුනනායගම් මහත්මිය වර්ෂ 1989 සිට 1990 දක්වා කාල පරිච්ඡේදය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නියෝජිතවරියක ලෙස කටයුතු කළ බවට "ස්වර්ණවාහිනී" නාලිකාව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේද;

(ii) එසේ නම්, එකී ප්‍රකාශය සිදු කරන ලද්දේ කවර සාක්ෂි පදනම් කරගෙනද;

(iii) එකී සාක්ෂි වැදගත්කමකින් යුතුයැයි සළකනු ලබන්නේ නම්, කුනනායගම් මහත්මිය නෙරපීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් කාල පරිච්ඡේදය තුළ සහ ඒ ආසන්න කාලයේදී කුනනායගම් මහත්මිය මානව හිමිකම් ක්‍රියාකාරිණියක් වශයෙන් කටයුතු කළ බවත්, ඇය අමාත්‍යවරයා ද සම්බන්ධවී සිටි "මව්වරුන්ගේ පෙරමුණ" නමැති සංවිධානයේ ක්‍රියාකාරකම්වලට සහයෝගය දක්වමින් කටයුතු කළ බවත් එතුමා දන්නෙහිද?

(ඇ) කුනනායගම් මහත්මිය ත්‍රස්තවාදයට අනුකම්පාව දක්වන බවට චෝදනා කිරීමට හේතුව වන්නේ ඇය මානව හිමිකම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වීමද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

6062/'15

6\.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී රේඛීය අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ උතුරු පළාත් අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ අධ්‍යාපන සම්මන්ත්‍රණය පිළිබඳව; සහ

(ii) එම සම්මන්ත්‍රණයේ අරමුණු, සම්මන්ත්‍රණයට වෙන්කළ මුදල්, සම්මන්ත්‍රණයේදී ගනු ලැබූ තීරණ පිළිබඳව;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත අ(ii) හි සඳහන් කරුණුවලට අදාළව ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6074/'15

7\.

ගරු ටී. බී. ඒකනායක මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘතීන් මේ වන විට නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එකී ව්‍යාපෘති නවතා දැමීම හේතුවෙන් රැකියා අහිමි වූ පිරිස කොපමණද;

(iii) ඔවුන්ගේ රැකියා අහිමිවීමේ ගැටලුවට ලබා දෙන විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5757/'14

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය තුළ වාර්තා වූ ළමා අපචාර සිදුවීම් සංඛ්‍යාව, ස්ත්‍රී දූෂණ සිදුවීම් සංඛ්‍යාව හා මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත සිදුවීම්වලට වරදකරුවන් වූ රාජ්‍ය නිලධාරීන් හා දේශපාලනඥයන්ගේ නම්, ලිපිනයන්, දුරකථන අංක හා අනෙකුත් තොරතුරු කවරේද;

(iii) එම නිලධාරීන්ට හා දේශපාලනඥයන්ට ලබාදුන් දඬුවම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ළමා අපචාර, ස්ත්‍රී දූෂණ හා මත්ද්‍රව්‍ය වැරදි සඳහා මෙරට ප්‍රමාණවත් නීති ක්‍රියාත්මක නොවන්නේද;

(ii) එසේ නම්, එම නීති සංශෝධනයට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

(iv) එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6024/'15

9\.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හිටපු ආරක්ෂක ලේකම්වරුන් අතරින් මේ වන විට වැඩිම ජීවිත අවදානමක් පවතින ලේකම්වරයා කවුරුන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිටපු ආරක්ෂක ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මහතා සේවයෙන් ඉවත් වූ පසු ලබා දී තිබූ ආරක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම ආරක්ෂකයින්ගේ සංඛ්‍යාව සංශෝධනය කර තිබේද;

(iii) එසේ නම්, දැනට සිටින ආරක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පවතින ජීවිත අවදානම මත ගෝඨාභය රාජපක්ෂ මහතාට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබා දී තිබේද;

(ii) ඒ මහතාගේ ආරක්ෂාවට අදාළ වගකීම රජය භාරගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6055/'15

10\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජසේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින කතා කිරීමට නොහැකි, ශ්‍රවණාබාධිත ජනගහනය කොපමණද;

(ii) ඔවුන් අතරින් රජයේ නිල හැඳුනුම්පත ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රවණාබාධිත අය සඳහා රජය ලබා දී ඇති පහසුකම් කවරේද;

(iv) ශ්‍රවණාබාධිත අය සඳහා සහය ලබා දීමට සිටින භාෂා පරිවර්තකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රවණාබාධිත ප්‍රජාව සඳහා රියදුරු බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

(ii) විකල්ප තාක්ෂණික ක්‍රම භාවිත කර හෝ ඔවුන්ට රියැදුරු බලපත්‍ර ලබා දීමට ඇති හැකියාව පරීක්ෂා කර තිබේද;

(iii) මින් පෙර ශ්‍රවණාබාධිත අය සඳහා රියදුරු බලපත්‍ර ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රවණාබාධිත අයට අධ්‍යාපනය ලබා දීම සඳහා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා බඳවා ගෙන ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රවණාබාධිත අයට ඉගැන්වීම සඳහා ශ්‍රවණාබාධිත අය අතරින්, සුදුසුකම් අනුව තෝරාගත් අයට පත්වීම් ලබා දීමට හැකියාවක් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6057/’15

11.

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන ජනාධිපතිවරයා සිය ධුරයේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව ආපසු කැඳවන ලද තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ආපසු කැඳවීමට හේතුව කවරේද;

(iii) ආපසු කැඳවීමට පෙර ඔවුන්ගේ කාර්ය සාධකත්වය පිළිබඳව කිසියම් ඇගයීමක් සිදු කරනු ලැබුවේද;

(iv) මෙලෙස ඇතිවුනු පුරප්පාඩු සංඛ්‍යාව අතරින් මාස තුනක කාලයක් තුළ පුරවනු ලැබූ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත පුරප්පාඩු සඳහා නම් කරන ලද නිලධාරීන්ගේ නම්, ඉහළම අධ්‍යාපන සුදුසුකම්, ජ්‍යෙෂ්ඨත්වය සහ ශ්‍රී ලංකාව තුළ හා විදේශ දූත මණ්ඩලවල සේවා කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී පුරප්පාඩු සඳහා නම් කරන ලද නිලධාරීන් ශ්‍රී ලංකා විදේශ සේවයෙහි සේවා ව්‍යවස්ථාව තුළ නියම කර ඇති අවශ්‍යතාවන් සපුරාලන පළමු ශ්‍රේණියේ නිලධාරීන් වන්නේද;

(ii) 2015 ජනවාරි මාසය වන විට විදේශ දූත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් ඔවුන් අතර සිටියේද;

(iii) ඉහත කී විදේශ සේවා පුරප්පාඩු සඳහා නම් කරන ලද ලැයිස්තුවේ නම් සඳහන් නොවූ, දැනට තානාපතිවරුන් හෝ මහ කොමසාරිස්වරුන් ලෙස සේවය නොකරන සහ එකී ලැයිස්තුවේ සඳහන් යම් කිසි නිලධාරියෙකුට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි හෝ පළමු ශ්‍රේණියේ නිලධාරීන් සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6063/’15

12.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) චුන්නක්කම් හි ක්‍රියාත්මක වන “Northern Power Station” ආයතනය හා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය ඇතිකරගත් ගිවිසුමක් පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එකී ගිවිසුමට අනුව එම ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට මාසිකව ලබා දිය යුතු විදුලි ඒකක ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට “ Northern Power Station” ආයතනය ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) එම ආයතනය අක්‍රියවීම හේතුවෙන් උද්ගත වී ඇති ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6075/’15

13.

ගරු ටී. බී. ඒකනායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට රාජ්‍ය සේවකයින් කොපමණ සංඛ්‍යාවක් සඳහා යතුරුපැදි ලබාදී තිබේද;

(ii) මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති රජයේ සේවකයන් සඳහා යතුරුපැදි ලබාදීම සිදු කරන්නේද;

(iii) මේ වන විට ඊට අදාළ කටයුතු ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5758/’14

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ බ්‍රිතාන්‍ය යුගයේ සිට පැවති දැවැන්ත තාප්පය කඩා ප්ලාස්ටික් ආවරණය සහිත කම්බි දැලක් ගැසීමට කටයුතු කර ඇති බවත්;

(ii) එය වරායේ ආරක්ෂාවට තර්ජනයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් ඉදිකිරීම් වරාය අධිකාරිය විසින් සිදු කරන්නේද;

(ii) එම ඉදිකිරීම් පෞද්ගලික ආයතනයක් විසින් සිදු කරන්නේ නම්, එම ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය කවරේද;

(iii) එම සමාගමට එකී කොන්ත්‍රාත්තුව ලබාදීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iv) එම ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(v) ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් සමාගම් කවරේද;

(vi) එම සමාගම් විසින් ඉදිරිපත් කළ ටෙන්ඩර්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2014 වර්ෂයේදී කොළඹ වරායේ ආරක්ෂාව සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) 2015 වර්ෂය සඳහා කොළඹ වරායේ ආරක්ෂාව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6025/’15

15.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.31 දින වන විට සරත් ෆොන්සේකා මහතාට ලබා දී තිබූ ආරක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආරක්ෂකයින් කුමන ඒකකයක් යටතේ ලබා දී තිබුණේද;

(iii) මේ වන විට ඒ මහතාට ලබා දී ඇති ආරක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ මහතාගේ ආරක්ෂකයින් සංඛ්‍යාව සංශෝධනය කිරීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යුද සමයේදී රාජකාරියේ නියුතුව සිට මේ වන විට විශ්‍රාම ගෙන ඇති නාවික හමුදාපති, ගුවන් හමුදාපති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් හා පොලිස්පති යන තනතුරුධාරීන්ට ලබා දී ඇති ආරක්ෂකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 132 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2015 අප්‍රේල් මස 10) "අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීයික අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 81/'10]

පා. 82/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්ත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

6\.
ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

7\.
ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

8\.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

9\.
ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

10\.
ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

11.
ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

12.
ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

13.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදී සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

14.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

15.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික

ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

16.

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

17.

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

18.

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

19.

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

20.

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

21.

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

22\.

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

23\.

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

24\.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

25\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මඟින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

26\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

27\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

28\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන

සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මග හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

29.
ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

30.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

31.
ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

32.
ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

33.
ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

34.
ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

35.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

36.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

37.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'12

38.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'12

39.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'12

40.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය

ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'12

41.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'12

42.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණාධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.170/'12

43.
ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.171/'12

44.
ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.172/'12

45.
ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.175/'13

46.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.176/'13

47.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.177/'13

48.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25-30 ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'13

49.

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රිය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.179/'13

50.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.180/'13

51.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින්

සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.191/'13

52.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි  මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.192/'13

53.
ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.197/'13

54.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමූපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.198/'13

55.
ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

56.
ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට  අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

කපා.201/'14

57.
ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.202/'14

58.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.203/'14

59.
ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්විමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.204/'14

60.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රික විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.205/'14

61.
ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරිමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.206/'14

62.
ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.208/'14

63.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.209/'14

64.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.210/'14

65.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.211/'14

66.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.214/'14

67.
ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.215/'14

68.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.216/'14

69.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.217/'14

70.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.218/'14

71.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙලීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙලීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.219/'14

72.
ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.220/'14

73.
ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.221/'14

74.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.222/'14

75.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායීතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායීතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායීතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.223/'14

76.
ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.224/'14

77.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.225/'14

78.
ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.226/'14

79.
ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.227/'14

80.
ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.228/'14

81.
ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.229/'14

82.
ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.230/'14

83.
ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.231/'14

84.
ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.232/'14

85.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.233/'14

86.
ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.234/’14

87.
ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.235/’14

88.
ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.236/’14

89.
ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි “වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය” නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.237/’14

90.
ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් “මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය” නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.238/’14

91.
ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.239/’14

92.
ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.240/'14

93.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.241/'14

94.
ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.242/'14

95.
ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.243/'14

96.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.244/'14

97.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.245/'14

98.
ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.246/'14

99.
ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.247/'14

100.
ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.248/'14

101.
ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.249/'14

102.
ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.250/'14

103.
ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.251/'14

104.
ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පලිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.252/'14

105.
ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ධ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.253/'14

106.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.254/'14

107.
ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.255/'14

108.
ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.256/'14

109.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.257/'14

110.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර

ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.258/'14

111.

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.259/'14

112.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.261/'14

113.

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.262/'14

114.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.263/'14

115.

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.264/'14

116.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද

පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමග පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.269/'14

117.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.270/'14

118.

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.271/'14

119.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.272/'14

120.

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.273/'14

121.

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.274/'14

122.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.275/'14

123.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.276/'14

124.

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.277/'14

125.

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.278/'14

126.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.281/'14

127.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති

නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.282/'14

128.

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.285/'14

129.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.286/'14

130.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.306/'15

131.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීම,— දිනකට දුම්රිය ගමන් වාර 15 ක් පමණ කොළඹ සිට අවිස්සාවේල්ල බලා දිවෙන, දුම්රිය ධාවනයට එක් වී වසර 100 ක් පමණ ගත වී ඇති කැළණිවැලි දුම්රිය මාර්ගය, කොළඹ දිස්ත්‍රික්කයේ සීඝ්‍රයෙන් නාගරීකරණය වන මහරගම, හෝමාගම සහ පාදුක්ක යන ප්‍රදේශ හරහා වැටී ඇති අතර, හයිලෙවල් පාර හා බැඳුනු අතුරු මාර්ග පද්ධති හරහා පෞද්ගලික හා පොදු ප්‍රවාහන සේවාවන් ද භාවිතා කරන මෙම ප්‍රදේශයේ ජනතාව දෛනිකව, උදෑසන හා සවස් කාලයේ දැඩි රථවාහන තදබදයකට මුහුණ දෙන බැවින්, මෙම තත්ත්වයට විකල්පයක් ලෙස මෙම දුම්රිය මාර්ගය පුළුල් කොට සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් දැඩිව මතුවී ඇති අතර දුම්රිය මාර්ගය නවීන, සැහැල්ලු හා විද්‍යුත් දුම්රිය මාර්ගයක් බවට පත් කිරීම හෝ ඉන්ධන පිරිවැය හා කාලය අවම කරන ඉහළින් ගමන් කරන (Monorail) දුම්රිය මාර්ගයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය සැලසුම් කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*132.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත යටතේ නියෝගය,— 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 69 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත්කළ අතුරු කමිටුවේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීම සම්බන්ධයෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 27 දිනැති අංක 1916/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.06.11 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*133.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*134.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*135.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*136.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*137.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*138.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*139.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන)කපනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*140.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,700,000,000 සිට<br>රු. 2,200,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,102,000,000 සිට<br>රු. 6,602,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 850,000,000 සිට<br>රු. 1,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*141.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000<br>රු. 25,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*142.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | | |
|---|---|---|---|
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,900,000,000 සිට<br>රු. 2,500,000,000 දක්වා | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,500,000,000 සිට<br>රු. 2,250,000,000 දක්වා | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*143.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000 සිට<br>රු. 170,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*144.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 " කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට<br>රු. 450,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*145.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2014 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතියට යටත්ව මේ සමග දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල පහත දැක්වෙන විෂය අංකවලට අදාළ වන්නා වූ පනතේ තෙවන උපලේඛනයේ තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක IIIහි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි. 14001, 18201, 10501, 22801, 20801, 27701, 30301, 26901, 27001, 27201, 24201, 28601, 10201, 25601, 25801, 28201, 28501, 11601, 28801, 30601, 27901, 27801, 27401, 27501, 21901, 17801, 12601, 11101, 18801, 21101 සහ 19001.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 14001 | 7,000,000 | 10,000,000 | 3,700,000 | 4,000,000 | - | - | 1 |
| 2 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය | 18201 | 5,000,000 | 8,000,000 | 1,100,000 | 4,100,000 | - | - | 2 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 10501 | 140,000,000 | 170,000,000 | 60,000,000 | 90,000,000 | - | - | 3 |
| 4 | අධිකරණ අමාත්‍යාංශය | 22801 | 260,420,000 | 290,420,000 | 170,000,000 | 175,000,000 | 850,000,000 | 1,100,000,000 | 4 |
| 5 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | 9,000,000 | 12,000,000 | - | - | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 25,000,000 | 24,000,000 | - | - | 6 |
| 7 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 7 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | 23,000,000 | 18,000,000 | 90,000,000 | 100,000,000 | 8 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - අම්පාර | 27001 | - | - | 35,000,000 | 30,000,000 | - | - | 9 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 65,000,000 | - | - | 10 |
| 11 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 24201 | - | - | 2,000,000 | 1,700,000 | - | - | 11 |
| 12 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 28601 | - | - | 12,000,000 | 11,500,000 | - | - | 12 |
| 13 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 10201 | 15,000,000 | 12,000,000 | 9,500,000 | 8,500,000 | - | - | 13 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 25601 | - | - | 56,000,000 | 53,000,000 | - | - | 14 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 25801 | - | - | 51,000,000 | 46,000,000 | - | - | 15 |
| 16 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 28201 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 16 |
| 17 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 150,000,000 | 120,000,000 | - | - | 17 |
| 18 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 11601 | 6,000,000 | 7,500,000 | - | - | - | - | 18 |
| 19 | මිනුම්පති දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 86,000,000 | - | - | 19 |
| 20 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 385,000,000 | 290,000,000 | - | - | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 27901 | - | - | 30,000,000 | 26,000,000 | - | - | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | - | - | 38,000,000 | 32,000,000 | - | - | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | 27401 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 23 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොලොන්නරුව | 27501 | - | - | 18,000,000 | 15,000,000 | - | - | 24 |
| 25 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | 8,000,000 | 8,011,000 | - | - | - | - | 25 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 17801 | 4,000,000 | 5,000,000 | - | - | - | - | 26 |
| 27 | අධ්‍යාපන අමාත්‍යාංශය | 12601 | - | - | 680,000,000 | 675,000,000 | - | - | 27 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 710,000,000 | 653,000,000 | - | - | 28 |
| 29 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 18801 | 2,000,000 | 2,060,110 | - | - | - | - | 29 |
| 30 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | - | - | 45,000,000 | 44,000,000 | - | - | 30 |
| 31 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 19001 | - | - | 83,000,000 | 60,000,000 | - | - | 31 |
| | එකතුව | | 456,420,000 | 524,991,110 | 2,905,300,000 | 2,666,700,000 | 940,000,000 | 1,200,000,000 | |

අත්සන් කළේ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.



2015 අප්‍රේල් 10 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*146.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*147.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*148.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*149.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1892/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*150.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 31 දිනැති අංක 1895/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*151.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*152.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 29 දිනැති අංක 1899/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*153.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 14 දිනැති අංක 1901/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*154.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 24 දිනැති අංක 1903/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*155.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*156.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*157.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*158.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.04.27 වැනි දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූර් ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*159.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.05.19 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

(අංක 974 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*160.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ 2014.10.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*161.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.09.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*162.

නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2014.09.24 දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*163.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*164.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*165.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*166.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*167.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝග (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*168.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*169.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*170.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

171.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

172.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

173.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

174.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

175.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---